


**මෙම සමාගමේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොල /කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල හා කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොල රත්මලාන පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පී (වායු සමීකරණ)11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** සියළුම වායු සමීකරණ යන්ත්‍ර හා පද්ධති වල නඩත්තු කටයුතු, අළුත් වැඩියාවන් හා සවිකිරීම් අධික්ෂණ නිළධාරීන් යටතේ සඳු කිරීම.

**රැකියාවේ වගකීම් :**

i සියළුම චිලර් වර්ග හා එයට අදාළ අනෙකුත් වායුසමීකරණ පද්ධති උපකරණවල අළුත් වැඩියා, පූර්ණ අළුත්වැඩියාද ඇතුළුව සිදු කිරීම.

1I වායුසමීකරණ යන්ත්‍රාගාර, යන්ත්‍ර සහ පද්ධති වල (විදුලි පාලක උපකරණ ඇතුළුව) පෙර ලැයිස්තු ගත සේවා සහ පූර්ව නඩත්තු කටයුතු අධීක්ෂණ නිළධාරින්ගේ උපදෙස් හා අධීක්ෂණ යටතේ පවත්වාගෙන යාම හා පවත්නා විශේෂිත තත්ත්වයන් පිළිබඳව නිළධාරීන් දැනුවත් කිරීම.

11I ඉහත සඳහන් පද්ධති වල හදිසි බිඳවැටීම් (විදුලි පාලක උපකරණ ඇතුළුව) සඳහා ක්ෂණිකව සහභාගී වී ඒවා නිවැරදි කිරීම හා ඒ සම්බන්ධ අදාළ අංශ සමග මනා සන්නිවේදනයකින් හා සහයෝගයෙන් කටයුතු කිරීම.

1V වායු සමිකරණ යන්ත්‍රාගාර, යන්ත්‍ර සහ පද්ධති, වාය සමන ජල පොම්ප, වායු සමන ජලනල සහ උපකරණ නිසි අවදායනයකින් හා අධීක්ෂණයකින්, මනා ක්‍රියාකාරීත්වයෙන් පවත්වා ගෙන යාම හා එයට අදාළ අමතර කොටස් හා යෙදවුම් පෙර ලැයිස්තු ගත කල යුතුවේ.

V ඉහත පද්ධති පෙර ලැයිස්තු ගත පරීක්ෂා කිරීම් කළ යුතු අතර, අදාළ වාර්ථා නිසි ලෙස පවත්වා ගෙන යාම.

VI අදාළ පද්ධතිවල දත්ත හා විශ්ලේෂණයන් ලබා ගැනීමට සහ වාර්තා ගත කිරීම් සිදු කිරීම සඳහා සහාය වීම.

VII අනෙකුත් වායු සමීකරණ කාර්මිකයින්ගේ කටයුතු සඳහාද අවශ්‍ය අවස්ථාවන්වලදී සහාය දැක්විය යුතු අතර අධීක්ෂණ නිළධාරින් විසින් කලින් කලට පවරනු ලබන අනෙකුත් සේවා කටයුතු ඉටු කිරීම.

VIII හදිසි ආපදාකාරී අවස්ථාවන්වලදී ගුවන් තොටුපළ නඩත්තු කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගී විම.

IX ඉහත සියළුම පද්ධතීන් පූර්ව නිරීක්ෂණය කර පූර්ව දෝෂ හඳුනා ගැනිම හා වාර්ථා කිරීම.

**සුදුසුකම් :**

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ වායු සමීකරණ ක්ෂේත්‍රයේ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය ආධුනිකත්ව සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

(ආ) ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටම (NVQ Level 4) වෘත්තීය සහතිකයක් වායු සමීකරණ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**සහ**

(ඇ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සිමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පත්‍රයක් පහත සඳහන් ලිපිනයට **2023 ඔක්තෝබර් මස 16 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (වායු සමීකරණ) II වන ශ්‍රේණිය** යන තනතුර සඳහන් කළ යුතුවේ.

තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

පාඨමාලා සහතික හා සේවා සහතික සහ අදාළ සහතිකවල ජායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් පතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්) ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Date: 04/10/2023